# සංක්ෂේපයෙන්

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන් ගේ වෘත්තීය අපේක්ෂණා සොයා බැලීම සහ අධ්‍යාපනය හා රැකියා නියුක්තිය ගැලපීම සඳහා විධිමත් පාසලේ කාර්ය භාරය විමසීම යන මාතෘකාව ඇසුරෙන් මෙහෙය වූ මෙම අධ්‍යයනයේ අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ උගත් තරුණ පිරිසේ රැකියා වියුක්ති මට්ටම ගණනය කිරීම, ශ්‍රී ලංකාවේ විද්‍යාල තලයේ පසුවන සිසුන් සඳහා සලසා ඇති වෘත්තියාභිමුඛ කිරීමේ වැඩ පිළිවෙළ සොයා බැලීම, සංවර්ධිත හා සංවර්ධනය වන සමහර රටවල් විද්‍යාල තල මට්ටම අවසන් කරන සිසුන් සඳහා සලසා ඇති වෘත්තියාභිමුඛ කිරීමේ ප්‍රයත්න හඳුනා ගැනීම, උසස් පෙළ සිසුන් ගේ ස්ත්‍රී පුරුෂ බව, විෂය ධාරාව, මව්පියන් ගේ සමාජ පන්තිය, පාසල් වර්ගය හා ග්‍රාමීය නාගරික බව යන පසුබිම් විචල්‍ය අනුව වෘත්තීය අපේක්ෂණා සම්බන්ධ වන්නේ ද යන්න සසඳා බැලීම, වෘත්තීය අපේක්ෂණා හා රැකියා වෙළඳ පොළෙහි ඉල්ලුම අතර ඇති සබඳතාව පරීක්ෂා කිරීම හා ශ්‍රී ලංකාවේ විධිමත් පාසල තුළින් සිසුන් වෘත්තියාභිමුඛ කිරීම සඳහා ගත හැකි පියවර විමසා බැලීමයි.

මේ සඳහා බස්නාහිර පළාතේ ජාතික පාසල් , 1ඒබී පාසල් , 1සී පාසල් හා පෞද්ගලික පාසල් 12 ක් තෝරා ගැණිනි . අදාළ දත්ත රැස් කිරීමේ දී ලිඛිත මූලාශ්‍ර , ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා නියමාවලී භාවිත කෙරිණි .

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනය පිළිබඳ විමසා බැලීමේ දී 1972 , 1981 හා 1997 යන වර්ෂයන්හි ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අධ්‍යයනයට ලක් විය .1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් සිසුන් වෘත්තියාභිමුඛ කිරීමේ ප්‍රයත්න ලෙසින් ප්‍රාග්වෘත්තීය 1 හා 11 ක්‍රියාත්මක කිරීම, ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධියේ හර විෂයමාලාව, වෛකල්පික විෂය හා ව්‍යාපෘති ඇතුළත් වීම, සුවිශේෂී විය. 1981 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කනිෂ්ඨ ද්විතියික අවධියේ ව්‍යවහාරික කුසලතා විෂය එක්වීම, ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධිය සඳහා තාක්ෂණික විෂය එක් කිරීම, ඉංග්‍රීසි අධ්‍යාපනය හා පාඨශාලා ශිෂ්‍ය මාර්ගෝපදේශ සේවය සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම, වැදගත් වූ අතර 1997 ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විෂය මාලාවට විද්‍යාව හා තාක්ෂණවේදය යන විෂය ඇතුළත් වීම, උසස් පෙළ විෂය 03 දක්වා අඩුවීම, ප්‍රායෝගික වැඩ හා ව්‍යාපෘති සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දීම, පොදු ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයක් ඉදිරිපත් කිරීම, වෘත්තීය

මාර්ගෝපදේශය සඳහා සුවිශේෂී වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හා පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයක් යෝජනා කිරීම වැදගත් වූ බව හඳුන්වා දිය හැකියි.

අධ්‍යයනයට ලක් වූ සංවර්ධිත රටවල අධ්‍යාපන රටා හා වෘත්තියාභිමුඛ කිරීම පිළිබඳ විමසා බැලීමේ දී රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය ද විධිමත් අධ්‍යාපන කාර්යයට සම්බන්ධ වී තිබීම දක්නට ලැබේ . පාසල තුළ වෘත්තීය මාර්ගෝපදේශය ක්‍රියාත්මක වීම , විවිධ විෂය බාහිර සංවිධාන පාසලට උදව් කිරීම , වෘත්තීය නිපුණතා සංවර්ධනය පාසල් මට්ටම තුළ දී සිදු වීම , අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අදාළ වෙනත් දෙපාර්තමේන්තු සම්බන්ධ වී කටයුතු කිරීම , කර්මාන්ත හා පාසල අතර සම්බන්ධතාවක් ගොඩ නැඟී තිබීම, ප්‍රාදේශීය ආයතන වලට අධ්‍යාපනය සම්බන්ධ බලතල හිමි වී තිබීම, විශාල සමාගම් , උසස් පාසල් හා විශ්වවිද්‍යාල අතර සම්බන්ධතාවක් පැවැත්වීම යන විශේෂ ලක්ෂණ ක්‍රියාත්මක වේ. නව සංවර්ධිත රටවල මානව ප්‍රාග්ධන න්‍යාය ක්‍රියාත්මක වීම ද සිදු වේ.

මෙහි දී ශ්‍රී ලංකාව ඇසුරින් ලබා ගත් දත්ත කයි වර්ග, වගු , ප්‍රතිශත හා විස්තර මඟින් විශ්ලේෂණය කිරීමෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කෙරිණි. ඒ අනුව සිසුන් ගේ වෘත්තීය අපේක්ෂණත්, ස්ත්‍රී පුරුෂ බව, විෂය ධාරා, පාසල, මව ගේ සමාජ පන්තිය හා ග්‍රාමීය හා නාගරික බව යන සාධකත් අතර වෙසෙසි බවක් පවතින බව නිගමනය කළ හැකි විය. පියා ගේ බලපෑමේ වෙසෙසි බවක් දක්නට නො ලැබිණි. මේ අතර වෘත්තීන් තෝරා ගැනීමේ දී රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික අංශය වෙත නැඹුරුතාවක් දැක් වූ අතර ඕනෑ ම රැකියාවක් කිරීමේ රුචිකත්වයක් ද සිසුන් තුළ විය. මෙහෙක් ප්‍රචලිතව පැවති මතය වූයේ රජයේ රැකියා කෙරෙහි වැඩි නැඹුරුතාවක් සිසුන් දක්වන බවකි. ශ්‍රම වෙළඳ පොළෙහි ශ්‍රම ඉල්ලුම රාජ්‍ය අංශයෙන්, පෞද්ගලික අංශය වෙත මාරු වෙමින් පවතී.

විෂයමාලාව පුළුල් කිරීම, පෞද්ගලික ක්ෂේත්‍රය සහාය කර ගැනීම, ශිෂ්‍ය ආකල්ප වෙනස් කිරීම, රැකියා සපයන බාහිර ආයතන හා පාසල සම්බන්ධ කිරීම, ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය, ශිෂ්‍ය මාර්ගෝපදේශ කටයුතු ක්‍රමවත් කිරීම, රැකියා සපයා ගැනීමට සහායවීම සඳහා සම්බන්ධීකරණ ක්‍රමයක් රජයේ වගකීම යටතේ ස්ථාපනය කිරීම, පාසල් ව්‍යුහය වෙනස් කිරීම, අධ්‍යාපනය හා පුහුණුව සමානව ලබාදීම හා රැකියා සපයන ආයතන, සේවක මණ්ඩලයෙන් නිශ්චිත සංඛ්‍යාවක් ආධුනික පුහුණුවන්නන් සඳහා වෙන් කිරීමට නීති සැකසීම , රැකියා ප්‍රශ්නයට පිළියම් වශයෙන් යෝජනා කෙරිණි.